**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව</u>**
**<u>2021.03.01</u>**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සම සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් සහ ගරු මැති ඇමතිතුමන්ලාගේ සහභාගීත්වයෙන් 2021.03.01 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ප්‍රථමයෙන්ම, ගරු සම සභාපතිතුමන් සහ මැති ඇමතිතුමන්ලා ඇතුළු පැමිණ සිටි සියළුම දේශපාලන නායකත්වය හා රාජ්‍ය නිලධාරීන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පිළිගන්නා ලද අතර, සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය මත ක්‍රියාත්මක ග්‍රාමීය ආර්ථිකය නගාසිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව හා දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව අදාල මැති ඇමතිවරුන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද බව හා එහිදී ගනු ලැබූ තීරණ අයවැය ලේඛනයට සමගාමීව ක්‍රියාත්මක කිරීමට නියමිත බවත්, සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව හා ජීවනෝපාය සංවර්ධන කමිටුව ඉදිරියේදී පැවැත්වීමට යෝජිත බවත් ප්‍රකාශ කරන ලදි. තව ද, දිස්ත්‍රික්කයේ වැව් 100ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ඉලක්කයෙන් යුතුව ක්‍රියාත්මක වාරි සෞභාග්‍යා වැඩසටහන ආරම්භ කොට එහි කටයුතු ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරමින් පවතින බව ප්‍රකාශ කරන ලදි. ඊට අමතර වශයෙන් දිස්ත්‍රික්කයේ වී වගාව සඳහා අවශ්‍ය පොහොර ලබා දීමට අදාල දිස්ත්‍රික් කමිටුව, සෞභාග්‍යා ගම්මාන වැඩසටහන, අපනයන කලාප පිහිටුවීමේ වැඩසටහන, රාජ්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක පළතුරු, භෝග හා කැළෑ වැවීමේ වැඩසටහන, ග්‍රාමීය, ප්‍රාදේශීය හා පාසල් මට්ටමින් ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන, "හුස්ම දෙන තුරු" වැඩසටහන යටතේ වීරවිල වැව් තාවුල්ලේ මී පැල සිටුවීම ආදී වශයෙන් වැඩසටහන් රාශියක් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන බව පෙන්වා දෙන ලදි. අලි මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බවත්, පොලිස් විශේෂ කාර්ය බලකාය සමගින් මහවැලි ඉඩම් කළමනාකරණය සඳහා කටයුතු සිදු කරන අතර ගරු වාරිමාර්ග අමාත්‍යතුමන් විසින් ඒ සම්බන්ධයෙන් පොලීසිය හා විශේෂ කාර්ය බලකාය වෙත උපදෙස් ලබා දීමක් සිදු කළ බවද ප්‍රකාශ කරන ලදි. දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලය පිහිටුවීමට කටයුතු සිදුකරමින් පවතින අතර ඊට සමගාමීව ගරු අග්‍රාමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් ශාසනාරක්ෂක බල මණ්ඩලවල සේවය කළ ස්වාමීන් වහන්සේලාගේ සේවය අගය කිරීමක් සිදුකළ බව ද, විසල් හම්බන්තොට වැඩසටහනට සමගාමීව වලස්මුල්ල හා ලුණුගම්වෙහෙර නගර සැලසුම් කටයුතු අවසන් කර ඇති බවද දන්වන ලද අතර පවතින කොවිඩ් වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා දේශපාලන හා රාජ්‍ය අංශයේ සියළු දෙනා සහයෝගීව කටයුතු කරන බවත් පෙන්වා දෙන ලදි. ඉන් අනතුරුව, පවතින ගැටළු විසඳාගනිමින් දිස්ත්‍රික්කයේ සංවර්ධනය කඩිනම් කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමේ වැදගත්කම පෙන්වා දෙමින් සභාවේ කටයුතු කරගෙන යාම සඳහා ගරු සභාපතිතුමන් වෙත අවස්ථාව ලබාදෙන ලදි.
ඒ අනුව 2020.11.09 දිනැති රැස්වීම් වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සභා සම්මත කරන ලද අතර, අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **01** | **වාරිමාර්ග ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 1.1 | වාරි සෞභාග්‍යා ජාතික වැඩසටහන යටතේ 2021 වසර සඳහා තොරාගත් වැව් නාම ලේඛනය සඳහා අනුමැතිය ලබා ගැනීම | දිස්ත්‍රික්කයේ සංවර්ධනය විය යුතු වැව් 100ක් (වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් 55, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් 30, පළාත් සභාව යටතේ 15) ප්‍රමුඛතාවය අනුව හඳුනාගෙන ඇති බවටත්, ප්‍රථමයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 මූලික කරගනිමින් වැව් 12ක කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත බවටත්, වියදම් අඩු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවට | පවතින ගැටළු විසඳා ගනිමින් එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | වාරිමාර්ග අධ්‍යක්ෂ/ සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අයත් වාහන හා යන්ත්‍ර යොදාගැනීමට අපේක්ෂිත බවටත් ප්‍රකාශ කරන ලදි.<br>වැව් රක්ෂිතවල අනවසර ඉදිකිරීම් පවතින බවත්, ඇතැම් විට බලපත්‍ර හෝ ඔප්පු ලබාදීම් ද සිදු කර ඇති බවත් ඒ හරහා පොහොර සහනාධාර ලබා ගන්නා අවස්ථා ද පවතින බවත් පෙන්වා දෙන ලද අතර, එම ගැටළු විසඳා ගැනීම සඳහා වැව්වල මායිම් හඳුනාගනිමින් සීමා නිරවුල් කර අනවසරකරුවන් ඉවත් කිරීම ප්‍රථමයෙන්ම සිදු කළ යුතු බව ද පෙන්වා දෙන ලදි. එමෙන්ම මෙම මූලික වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු බව ද පෙන්වා දෙන ලදි. | | |
| 1.2 | උද්දකන්දර වැවට අයත් රක්ෂිතය නිරවුල් කර ගැනීම | උද්දකන්දර වැවට අයත් අක්කර 15ක පමණ ප්‍රමාණයක් අනවසරකරුවන් අල්ලා ගෙන ඇති බවට කරුණු ඉදිරිපත් වූ අතර, එම ගැටළුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡා කර විසඳුම් ලබා ගැනීම සුදුසු බව පෙන්වා දෙන ලදි.<br>ඇතැම් නිලධාරීන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සඳහා සහභාගී නොවන බවට ද කරුණු ඉදිරිපත් විය. | මෙවැනි ගැටළු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී විසඳා ගැනීමට කටයුතු කල යුතු බවත්, වගකිවයුතු සියළුම නිලධාරීන් ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවලට සහභාගී විය යුතු බවත්, පක්ෂ භේදයකින් තොරව අදාල ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරුන් කමටු සඳහා කැඳවිය යුතු බවත්, රැස්වීම් පැවැත්වෙන කාල සටහන් කල් වේලා ඇතිව ලබා දිය යුතු බවත්, සාකච්ඡා කළ යුතු කරුණු කල් වේලා ඇතිව යොමු කිරීමට සියළු දෙනා වගබලා ගත යුතු බවත් අවධාරණය කරන ලදි. | සියළුම රාජ්‍ය නිලධාරීන් |
| 1.3 | රිදියගම වලව වම් ඉවුර ව්‍යාපාරයට අයත් කෘෂි බිම්වල වැලි කැපීම හේතුවෙන් පැන නැගී ඇති ගැටළු | සරු කෙත් ගොවි සංවිධානය විසින් මේ පිළිබඳව තොරතුරු ලබා දී ඇති බවත්, මෙම කටයුතු කලක් තිස්සේ සිදු වෙමින් පවතින බවත්, පොඩි ප්‍රමාණවලට අවසරපත් ලබා ගනිමින් විශාල වශයෙන් වැලි කැපීම සිදුවන බවත් ප්‍රකාශ කරන ලදි.<br>කුඹුරු ඉඩම්වල වැලි කැපීම් සඳහා බලපත්‍ර ලබා දී නොමැති බවත්, ඒකාබද්ධ පරීක්ෂණයක් සිදු කර අදාල සියළු නිර්දේශ ලබා ගැනීමෙන් | ගංගා, වැව් හා කුඹුරු ඉඩම්වල වැලි කැපීම වහාම නතර විය යුතු බවත්, ඒ සඳහා ග්‍රාම නිලධාරීවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත වගකීම් ලබා දිය යුතු බවත් පෙන්වා දෙන ලද අතර, අවසර පත් ලබාදීම සම්බන්ධ තොරතුරු අදාල | කැනීම් ඉංජිනේරු - භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශය / අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අනතුරුව අවසරපත් ලබා දීම සිදු කරන බවත්, ලබාදී ඇති බලපත්‍ර මඟින් වැලි කැපීම් නිරන්තරයෙන් අධීක්ෂණය කරන බවත් පෙන්වා දෙන ලදි.<br>ඉදිරියේ දී ලංකාවේ වැලි අවශ්‍යතාවයෙන් සම්පූර්ණ කළ හැක්කේ 50%ක ප්‍රමාණයක් බව බවත්, සංවර්ධන කටයුතු සඳහා වැලි ලබා ගැනීමේ විශාල අර්බුධයනට මුහුණපා ඇති බවත්, වැලි අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමේ දී ඇතැම්විට මෙවැනි ප්‍රායෝගික ගැටළු මතුවන බවත්, මේ සම්බන්ධ ජනාධිපති කාර්යසාධක බලකායක් ද ස්ථාපිත කර ඇති බවත් පෙන්වා දෙන ලදි. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ලබා දෙන ලෙසත්, ඉදිරියේදී කරනු ලබන ඉල්ලීම් ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | |
| 1.4 | කුඹුරු හා ගොඩ ඉඩම්වල වැලි කැපීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | කුඹුරු ඉඩම්වල වැලි කැපීම හේතුවෙන් ඇතිවන වලවල් පිරවීම සිදු නොවන බැවින් වාරි පද්ධතිය ක්‍රමවත්ව පවත්වා ගැනීමට ගැටළු මතු වී ඇති බවත්, ඒ හේතුවෙන් කුඹුරු යටවීම නිසා ගොවීන් අපහසුතාවයට පත් වී ඇති බවත් පෙන්වා දෙන ලදි.<br>අවසර පත් ලබා දීමේ දී ඒ පිළිබඳ නිසි අධීක්ෂණය තිබිය යුතු බව පෙන්වා දෙන ලද අතර වැව්වලින් ඉවත් කරන පස්මෙම වලවල් වැසීම සඳහා යොදාගත හැකි බවට කරුණු ඉදිරිපත් විය.<br>සීමිත නිධාරීන් පිරිසක් සිටින බැවින් ඇතැම්විට දිස්ත්‍රික්කය පුරා අධීක්ෂණ කටයුතු සිදු කිරීමේ අපහසුතාවයන් පවතින බවට ද කරුණු ඉදිරිපත් විය. | නව උපාධිධාරී පත්වීම් වලින් නිලධාරී ගැටළුව විසඳා ගැනීමට කටයුතු කරන ලෙසත්, වැලි කැපීමෙන් ඇතිවන වලවල් වැසීම සම්බන්ධ ප්‍රගතිය මීළඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙසත්, වැලි බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් රඳවාගෙන ඇති තැන්පතු සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | අතිරේක දිස්ත්‍රික් ලේකම්/ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/ වාරිමාර්ග අධ්‍යක්ෂ/ කැනීම් ඉංජිනේරු - භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශය |
| 1.5 | ලුණුගම්වෙහෙර වාරි ව්‍යාපෘතිය මඟින් පිටවන ජලය බූන්දල කලපුව වෙත එක්වීම හේතුවෙන් ඇතිවන ගැටළු | දේශගුණික සුහුරු ව්‍යාපෘතිය මඟින් මෙම ගැටළුව හඳුනාගෙන ඇති බවත්, ඒ සඳහා ඇල මාර්ගයක් ඉදිකිරීමට රු.මි.300ක පමණ මුදලක් වැය වන බවත්, ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ව්‍යාපෘතිය සතු නොවන බැවින් වනජීවී හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවලින් දායකත්වයක් ලබාගත යුතු බව පෙන්වා දෙන ලදි. | වනජීවී, වාරිමාර්ග හා දේශගුණික සුහුරු ව්‍යාපෘතිය ඒකාබද්ධ වී ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | අධ්‍යක්ෂ - වාරිමාර්ග/ ව්‍යාපෘති අධ්‍යක්ෂ දේශගුණික සුහුරු ව්‍යාපෘතිය/ සහකාර අධ්‍යක්ෂ - වනජීවී (දකුණ) |
| 1.6 | රොඩීමා බස්නාව අවහිර වීම හේතුවෙන් මතු වී ඇති ගලැටළු | බස්නාවේ ජලය බැසයාම අවහිර වීම නිසා ප්‍රදේශයේ ජල ගැලීම් තත්ත්වයක් ඇවන බවත්, අම්බලන්තොට වී පර්යේෂණ ආයතනය අසලද එවැනි තත්ත්වයක් පවතින බවත් පෙන්වා දෙන ලදි. අනවසර ඉදිකිරීම් හේතුවෙන් මෙම ගැටළු මතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට/ අම්බලන්තොට / දිස්ත්‍රික් ඉංජිනේරු (වාරිමාර්ග) |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **02** | **පරිසර ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 2.1 | සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම | ශ්‍රී ලංකාව තුළ පවතින හායනයට පත් වූ ගංගා යථා තත්ත්වයට පත් කිරීම, ජෛව විවිධත්ව සංරක්ෂණය කිරීම, පානීය ජල සුරක්ෂිතතාවය ඇති කිරීම, ජලය තිරසර ලෙස සංවර්ධනය සඳහා භාවිතා කිරීම සා ගහ රක්ෂිත ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම යන අරමුණු පෙරදැරිව 2020 වසරේ සිට මෙම වැඩසටහන ආරම්භ කරන ලද බව පෙන්වාදෙන ලදි.<br>දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමමින් කමිටු පිහිටුවා ඒ හරහා ගැටළු හඳුනාගිනිමින් විසඳුම් හා යෝජනා ක්‍රියාත්මක කිරීම සිදුවන බවට කරුණු ඉදිරිපත් කරන ලද අතර දේශීය අරමුදල් භාවිතා කරමින් සුරකිමු ගංගා ලේකම් කාර්යාලය අනුබද්ධිතව අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල සහභාගීත්වයෙන් යුතුව කමිටු ක්‍රියාත්මක කරමින් දිස්ත්‍රික් මට්ටමින් පවතින ගැටළු මේ වන විට හඳුනාගෙන ඇති බව පෙන්වා දෙන ලදි. ඕනෑම ස්ථානයකින් ජලය ප්‍රයෝජනයට ගතහැකි පරිදි ලංකාවේ ගංගා 103 ම සංවර්ධනය කිරීම අවසන් ඉලක්කය වන බවත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලව ගඟ ඇතුළු ගංගා ද ඒ අතර වන බවත් ප්‍රකාශ කරන ලදි. | එම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා අදාල සියළුම පාර්ශවයන්ගේ සහාය ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ - මධ්‍යම පරිසර අධිකාරිය |
| 2.2 | අඟුණකොළපැලැස්ස තලාව ගල් කොරියෙන් ගල් ලබා ගැනීමේ ගැටළුව | බලපත්‍ර නිකුත් කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු අතර ඒ සඳහා අවශ්‍ය වන භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශයේ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ඉල්ලා බවත්, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ මෙතෙක් ලැබී නොමැති බවත් දන්වන ලදි.<br>මධ්‍යම පරිසර අධිකාරියට නියමිත බලපත්‍ර ගාස්තු ගෙවා නොමැති බැවින් නිර්දේශ නිකුත් කර නොමැති බවට තොරතුරු අනාවරණය විය. | මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙසත්, ඊට අදාල කරුණු වාර්තා කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම්- අඟුණකොළ පැලැස්ස/ සහකාර අධ්‍යක්ෂ - මධ්‍යම පරිසර අධිකාරිය |
| 2.3 | බෙලිඅත්ත වාඩිය අක්කර 20ක පොල් ඉඩමේ වැලි කැපීම | මෙම ඉඩමේ විශාල වශයෙන් පස් කැපීම් සිදු කරන බවත්, ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් භාවිතා කරමින් ප්‍රවාහනය සිදු කරන බවට කරුණු ඉදිරිපත් වූ අතර පස් කපා ගොඩගැසීමට තාවකාලික අවසර පත්‍රයක් පමණක් ලබා දී ඇති බවත්, පස් ප්‍රවාහනයට අවසර දී නොමැති බවත්, මේ සම්බන්ධයෙන් පොලීසිය දැනුවත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | මේ සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට වාර්තා කරන ලෙස උපදෙස් ලබා දුනි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී/ ප්‍රාදේශීය ලේකම් - බෙලිඅත්ත / කැනීම් ඉංජිනේරු - භූවිද්‍යා හා |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | | පතල් කැනීම් කාර්යංශය |
| 2.4 | තංගල්ල ප්‍රදේශයේ වැලි සේදීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | ලුණුගම්වෙහෙර පුංචි අප්පු ජඳුර වැවෙන් ඉවත් කරන පස් තංගල්ල ප්‍රදේශයට ගෙනවිත් සෝදන බවට කරුණු ඉදිරිපත් වූ අතර, මෙම කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා සභාපති දැනුවත් කර නොමැති බව ප්‍රකාශ කරන ලදි.<br>වෙනත් සංවර්ධන කටයුත්තකදී ඉවත් කරන වැලි සේදීම සඳහා අවසර ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>වැව්වලින් කපා ඉවත් කරන පස් සේදීම සඳහා ගොවිසංවිධානයේ විරෝධතාවයක් නොමැති විට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලිඛිත ඉල්ලීමක් මත පස් සේදීමේ යන්ත්‍ර සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් අවසර ලබා දෙන බවත්, වැලි ලබා ගන්නා ආකාරය හා සෝදන ස්ථානය පිළිබඳව ස්ථානීය පරීක්ෂාවක් සිදු නොකරන බවත් එවැනි වැලි සේදීමේ ස්ථාන 40ක් පමණ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන බවත් කට්මුවේ අනුමැතිය ලබා දෙන්නේ නම් වැලි සේදීම නතර කල හැකි බවද ප්‍රකාශ කරන ලදි. | බලපත්‍ර ලබා දීමේ දී ඒ සම්බන්ධව නිරීක්ෂණය කිරීම හා පසු අධීක්ෂණය කිරීම අත්‍යාවශ්‍ය බවටත්, තාවකාලික කමිටුවක් මඟින් වැලි සෝදන ස්ථාන පිළිබඳව නිරීක්ෂණය කර පරිසර අමාත්‍යතුමන් වෙත වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දුන් අතර, මෙවැනි ගැටළුවලදී ප්‍රාදේශීය මට්ටමින් අදාල නිලධාරීන් තීන්දු ගෙන දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ට ඒ බව දැනුවත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් / සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් / සහකාර අධ්‍යක්ෂ- මධ්‍යම පරිසර අධිකාරිය / කැනීම් ඉංජිනේරු - භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යංශය |
| 2.5 | පරිසර අධිකාරියේ කාර්යාලය හම්බන්තොට ස්ථාපිත කිරීම | වසර 05ක කාලයක් සඳහා බදු ගිවිසුම් අත්සන් කිරීම හේතුවෙන් එම කටයුතු ප්‍රමාද වී ඇති බවත්, දැනට ඇති ගොඩනැගිල්ලේ අවම බදු මුදලක් අය කරන බවත් ප්‍රකාශ කරන ලදි.<br>මහජනතාවගේ පහසුව වෙනුවෙන් සියළුම රාජ්‍ය ආයතන එකම ස්ථානයක ස්ථානගත කිරීම අත්‍යාවශ්‍ය බවත්, මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලය හා භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශය හම්බන්තොට නගරසභාවට අයත් ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව පවතින බවටත්, විදුලිය, අරක්ෂාව හා පිරිසිදු කිරීම් ආදිය ද ඇතුළත්ව ගොඩනැගිල්ල ලබා දෙන බැවින් මුදල් අයකිරීමකින් තොරව කාර්යාලය ස්ථාපිත කිරීමට නොහැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ II වන අදියර ක්‍රියාත්මක කිරීමේ දී ස්ථිර විසඳුමක් ලබා දෙන තෙක් තාවකාලිකව හම්බන්තොට ප්‍රදේශයේ එම කාර්යාල ස්ථාපිත කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | කැනීම් ඉංජිනේරු- භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශය/ සහකාර අධ්‍යක්ෂ - මධ්‍යම පරිසර අධිකාරිය |
| 2.6 | කටුවන ෆයිනස් වගාව ඉවත් කිරීම | ෆයිනස් ශාක හේතුවෙන් ප්‍රදේශයේ වී වගාව සඳහා ජල හිඟයක් පවතින බවට කරුණු ඉදිරිපත් වූ අතර ක්‍රම ක්‍රමයෙන් එම ශාක ඉවත් කරන බවට කරුණු අනාවරණය විය. | එම කටයුතු කඩිනම් කර ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිසා වන නිලධාරී |
| 2.7 | තිස්සමහාරාම නිරෝෂා දිල්රුක්ෂි යන | කාලයක් තිස්සේ පවත්වාගෙන ආ මෙම ගල්කොරිය සඳහා පසුගිය වසර දෙක තුළ අවසර ලබා නොදීම හේතුවෙන් | මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස | සහකාර අධ්‍යක්ෂ (වනජීවී - |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | අයගේ ගල් කොරිය සඳහා අවසර ලබා නොදීම | ගැටළු මතු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>කඳුරුගල රක්ෂිතය ගැසට් වීමත් සමඟ එම ගල් කොරිය සඳහා අවසර ලබා දීමේ හැකියාවක් නොමැති බව ප්‍රකාශ කරන ලදි. | උපදෙස් ලබාදුනි. | දකුණ) / දිසා වන නිලධාරී - හම්බන්තොට |
| **03** | **අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 3.1 | පාසල්වල පවතින පන්ති කාමර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඇති වන ගැටළු | විහාරගල ඉසුරු ප්‍රාථමික පාසලට ප්‍රදේශයේ ළමුන් ඇතුලත් කරගැනීමේදී තදබදයක් පවතින බැවින් පන්තියක් වැඩිකර ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි. | පවතින තත්ත්වය පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ලේකම්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 3.2 | දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයට සිසුන් ඇතුලත් කිරීමේ දි මතු වී ඇති ගැටළු | යටාලතිස්ස පෝෂිත පාසලේ ළමුන් ඇතුලත් කර ගැනීමේ දී ශිෂ්‍යත්වධාරීන්ට ඉඩ නොමැති බවත් පෙර සමාන්තර පංති 10ක් පැවතුනද, මේ වන විට එය 7ක් දක්වා අඩු වීම හේතුවෙන් එම ගැටළු මතු වී ඇති බවත් පෙන්වා දෙන ලදි. | ගොඩනැගිලි ගැටළුවක් නොමැති බැවින් පෙර පැවති පරිදි සමාන්තර පංති 10ක් නැවත ස්ථාපිත කිරීම පිළිබඳව සලකා බලන ලෙස උපදෙස් ලබා දුනි.<br>ජාතික පාසල් සංවර්ධනය කිරීම යටතේ හඳුනාගෙන ඇති පන්නෙගමුව, යොධකන්ඩිය යන පාසල් සහ තිස්සමහාරාම පාසල වෙනුවට මහසෙන්පුර විද්‍යාලය සම්බන්ධ යෝජනා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ලේකම්- දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |
| 3.3 | අලුත්වැව ප්‍රාථමික විද්‍යාලයේ පළමු ශ්‍රේණියට පන්තියක් වැඩිකර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම | සමාන්තර පන්ති 07ක් පමණක් පවතින බැවින් පාසලට ළමුන් ඇතුළත් කර ගැනීමේ දී තදබදයක් පවතින බවටත්, ඊට විසඳුම් ලෙස සමාන්තර පන්තියක් වැඩි කිරීම සුදුසු බවටත් අදහස් ඉදිරිපත් විය.<br>අතිරික්ත ළමුන් 22 දෙනෙකු සිටින අතර පන්තියක් වැඩි කිරීමෙන් මහානාග ජාතික පාසලට ගැටළුවක් ඇති වන බැවින් වෙනත් විකල්ප විසඳුමක් මඟින් එම ළමුන් පාසලට ඇතුලත් කිරීමට කටයුතු කරන බවට ප්‍රකාශ කරන ලදි. | මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර ප්‍රදේශයේ ළමුන් 22දෙනාට අසාධාරණයක් නොවන පරිදි විසඳුමක් ලබාදෙන ලෙස උපදෙස් ලබා දුනි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල |
| 3.4 | ගොන්නෝරුව කනිටු විදුහලේ ගොඩනැගිලි අලුත්වැඩියා | මෙම විදුහලේ ගොඩනැගිලි අබලන් තත්ත්වයේ පවතින බැවින් අනතුරු ඇතිවිය හැකි බව පෙන්වා දෙන ලදි. | දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - හම්බන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | කිරීම | | තීරණය කරන ලදි. | |
| 3.5 | රන්න මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම | 1976.11.22 වන දින විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සඳහා ඉඩම් කොටසක් වෙන් කර ලබා දී ඇති බවටත්, දීර්ඝ කාලයක් තිස්සේ භාවිතයට නොගැනීම හේතුවෙන් විවිධ පාර්ශවයන් එම ඉඩම අත්පත් කර ගෙන ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. | අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඉඩම පවරා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල |
| 3.6 | හ/ඇත්ගාලමුල්ල කණිෂ්ඨ විද්‍යාලයේ ජාතික ශිෂ්‍ය භට බලකාය 10වන බලඇණිය ස්ථාපිත කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම | 2020 වර්ෂය සඳහා කිසිදු සිසුවකු පාලසට නොපැමිණීම හා නවක සිසුන් ඇතුලත් නොවීම මත එම පාසල විධිමත් පරිදි වසා ඇති බවත්, එම විද්‍යාල පරිශ්‍රයේ ජාතික ශිෂ්‍ය භට බලකාය ස්තාපිත කිරීමට එම බල ඇණියේ අණදෙන නිලධාරී විසින් ඉල්ලීම් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | මේ සම්බන්ධයෙන් කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ලේකම් - දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය / ප්‍රාදේශීය ලේකම් - තංගල්ල / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ- තංගල්ල |
| 3.7 | වීරවිල කුඩා ගම්මාන 18 කණිෂ්ඨ විද්‍යාලයේ 10,11 ශ්‍රේණි ආරම්භ කිරීම | 1990 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම පාසලේ මේ වන විට 9 ශ්‍රේණිය දක්වා පමණක් පන්ති පැවැත්වෙන බවත් ඉන් අනතුරුව ළමයින්ට වෙනත් පාසලකට ඇතුළත් වීමේ ගැටළුවක් පවතින බවත් පෙන්වා දෙන ලදි.<br>ගුරු හිඟයක් පවතින බැවින් පන්ති ඇතිකිරීම ගැටළු සහගත බවට කරුණු ඉදිරිපත් විය. | මේ ගැටළුව සම්බන්ධයෙන් අවධානය යොමු කොට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ- හම්බන්තොට |
| 3.8 | පොලොම්මාරුව අඳ ගොලු බිහිරි පාසල වසා දැමීම | මෙම පාසල වසා දැමීම හේතුවෙන් සිසුන් අපහසුතාවයට පත් වී ඇති බවට තොරතුරු වාර්තා විය.<br>මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරමින් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | පරීක්ෂණ කටයුතු කඩිනම් කර වාර්තාව ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල |
| **04** | **ජල සම්පාදන ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 4.1 | රිදියගම ජලාශයෙන් ජල සම්පාදන මණ්ඩලයට ලබා දෙන ජල ප්‍රමාණය දෙගුණ කර ගැනීම | මේ සම්බන්ධයෙන් ගොවීන් සමඟ සාකච්ඡා කර ඇති බව ප්‍රකාශ කරන ලදි. | අවශ්‍ය කටයුතු සිදු කර ප්‍රගතිය වාර්තා කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශිය ලේකම්- අම්බලන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 4.2 | ටී.ජේ.සී. අඹ වගාව ව්‍යාප්ත කිරීම සඳහා බදගිරිය ග්‍රාම නිලධාරී වසමේ භාවිතයට නොගන්නා ජල ටැංකිය යොදා ගනිමින් උස්සාන වාරි ව්‍යාපෘතියක් ආරම්භ කිරීම | බදගිරිය වසමේ ගොඩ ඉඩම් විශාල වශයෙන් පවතින බවත් ජලය නොමැති වීම හේතුවෙන් වගා කටයුතු කිරීම සඳහා එම ඉඩම් යොදා ගැනීමට නොහැකි වී ඇති බවත් දැනට භාවිතයෙන් ඉවත්ව ඇති ජල ටැංකිය යොදා ගනිමින් උස්සාන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සුදුසු බවටත් යෝජනා ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | ස්ථාන භාර නිලධාරී - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව |
| 4.3 | අඟුණකොළපැලැස්ස ජල යොජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම | ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරු විසින් දින 691ක් ප්‍රමාද කර ඇති බවට තොරතුරු වාර්තා විය.<br>එවැනි තත්ත්වයක් මත එම කොන්ත්‍රාත්කරු වෙත වකමුල්ල ල යෝජනා ක්‍රමය ලබා දීම ගැටළු සහගත බව පෙන්වා දෙන ලදි. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කිරීමටත්, කොන්ත්‍රාත්කරු සඳහා නව ව්‍යාපෘති පැවරීම සිදු නොකල යුතු බවටත් තීරණය කරන ලදි. | ප්‍රාදේශීය කළමනාකරු - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 4.4 | දෙවිරම්වෙහෙර ගලහිටියාව ජල ව්‍යාපෘතියේ ජලය බීමට සුදුසු තත්ත්වයේ නොමැති වීම | කිරිදි ඔයෙහි ජලය සෘජුවම මෝටර් මඟින් අක්‍රිය තත්ත්වයේ පවතින ජල පවිත්‍රාගාරයට යැවීම හේතුවෙන් එම ජලය බීමට නුසුදුසු තත්ත්වයේ පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br>මෙම ප්‍රජා ජල ව්‍යාපෘතිය ජල සම්පාදන මණ්ඩලයට පැවරීම පිළිබඳව සාකච්ඡා වූ අතර, පවතින ජල සම්පාදන ක්‍රමයෙන් ජලය ලබා දීමේ හැකියාවක් නොමැති බවත් ලුණුගම්වෙහෙර ජල සම්පාදන ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් මෙම ප්‍රදේශ ආවරණය වන බවත් පෙන්වා දෙන ලදි.<br>ප්‍රජා ජල ව්‍යාපෘතියේ කළමනාකරණ ගැටළුවක් පවතින බවට ද කරුණු අනාවරණය විය. | කළමනාකරණ ගැටළු යතා තත්ත්වයට පත්කර ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය කළමනාකරු - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| **05** | **විදුලිබල ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 5.1 | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ දී විදුලි රැහැන් ඉවත් කිරීම සඳහා විදුලිබල මණ්ඩලය ගාස්තු අය කිරීම | විදුලි රැහැන්වලට බාධාකාරී ගස් අතු කපා ඉවත් කිරීමේදී ඒ ආසන්නයේ ඇති විදුලි රැහැන් ඉවත් කර දීම සඳහා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රාදේශීය සභාවට ඇස්තමේන්තු ඉදිරිපත් කරන බවට කරුණු ඉදිරිපත් විය. | එම කටයුතු ගාස්තු අයකිරීමකින් තොරව සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | ප්‍රධාන විදුලි ඉංජිනේරු- ලංකා විදුලිබල මණ්ඩලය |
| 5.2 | වීරකැටිය බන්දුල මහතාගේ නිවසට විදුලිය ලබා ගැනීමට නොහැකි වීම | දෙපාර්ශවයක් අතර ප්‍රවේශ මාර්ගය සම්බන්ධයෙන් පවතින නඩු කටයුත්තක් හේතුවෙන් විදුලිය ලබා ගැනීමේ ගැටළුවක් පවතින බවට කරුණු අනාවරණය විය. | නඩු තීන්දුව අනුව ප්‍රවේශ මාර්ගය නිරාකරණය වීමෙන් පසු විදුලිය ලබා දීමට හැකි බව ප්‍රකාශ කරන ලදි. | ප්‍රාදේශීය ලේකම් - වීරකැටිය/ ප්‍රධාන විදුලි ඉංජිනේරු- ලංකා විදුලිබල මණ්ඩලය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **06** | **සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 6.1 | ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සහ පුහුණු මධ්‍යස්ථානයක් සඳහා භූමියක් ලබා ගැනීම | දැනට ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව තුළ අපහසුතා මධ්‍යයේ පවත්වාගෙන යන අතර ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පෙර පැවති ස්ථානයේ එය ස්ථාපිත කිරීම සඳහා වීරකැටිය ප්‍රාදේශීය සභාව එකඟතාවය පල කර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම්, ඕකෙවෙල |
| 6.2 | මධ්‍යම බෙහෙත් ශාලාවල් සඳහා ඉදිකර ඇති ගොඩනැගිලි සෞඛ්‍ය අංශයේ ප්‍රයෝජනය සඳහා භාවිතා කිරීම | භාවිතයට නොගෙන අතහැර දමා ඇති මධ්‍යම බෙහෙත් ශාලාවන් සඳහා ඉදිකරන ලද ගොඩනැගිලි සෞඛ්‍ය අංශයේ කටයුතු සඳහා යොදා ගැනීම සුදුසු බවට යෝජනා ඉදිරිපත් විය.<br>එම ගොඩනැගිලි සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා දීමක් සිදු කර නොමැති බවත්, ඇතැම් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති බවත් පෙන්වා දෙන ලදි. | එම කටයුතු කඩිනම් කිරීමට උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 6.3 | සෑම මසකම තුන්වන ඉරු දින ප්‍රජා සෞඛ්‍ය දිනය ලෙස නම් කිරීම | පවතින වසංගත තත්ත්වයන්ට මුහුණ දීම හා ඇතිවිය හැකි ව්‍යසන වලක්වා ගැනීම සඳහා පුද්ගලයින් තනි තනිව තම නිවෙස් හා අවට මාර්ග පිරිසිදු කර ගැනීමේ ක්‍රමවේදයක් ලෙස ප්‍රජා සෞඛ්‍ය දිනයක් නම් කිරීම සුදුසු බවත්, ඒ සඳහා ග්‍රාමීය මට්ටමින් කමිටු පිහිටුවීම සුදුසු බවත් යොජනා කරන ලදි. | ඒ සඳහා සියළුම දෙනා සහයෝගය ලබා දෙන ලෙස උපදෙස් ලබා දුන් අතර, ප්‍රාදේශීය සභා විසින් එම කටයුතු අධීක්ෂණය කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | සියළුම ආයතන ප්‍රධානීන් |
| 6.4 | කොවිඩ් පරීක්ෂණ සඳහා අවශ්‍ය PCR යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සම්බන්ධ ප්‍රගතිය | පැරණි රෝහලේ රසායනාගාරය කොවිඩ් පරීක්ෂණාගාරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා කටයුතු කරමින් පවතින බවත්, වරාය අධිකාරිය මගින් PCR යන්ත්‍රයක් ලබා දීමට එකඟ වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම පරීක්ෂණාගාරය ක්‍රියාත්මක කිරීම සඳහා සිදු කළ යුතු සංවර්ධන කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන අවශ්‍යතාවයක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කිරීමට තීරණය විය. | නියෝජ්‍ය අධ්‍යක්ෂ-කොවිඩ් 19 විශේෂ ප්‍රතිකාර ඒකකය |
| 6.5 | ඩෙංගු රෝගය නැවත ව්‍යාප්ත වීමේ අවධානමක් පැවතීම | දිස්ත්‍රික්කය තුළ ඩෙංගු රෝගීන් වාර්තාවීම වැඩිවීමක් පෙන්නුම් කරන බවත්, ග්‍රාමීය ඩෙංගු කමිටු සක්‍රීය කිරීම සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදි. | ඒ සඳහා සියළු දෙනාගේ සහාය ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / සියළුම ආයතන ප්‍රධානීන් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **07** | **ඉඩම් ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 7.1 | රක්ෂිත ඉඩම්වලට ව්‍යාජ පිඹුරු පත් හා නොතාරිස් ඔප්පු සකස් කර ඉඩම් ජාවාරම් සිදු කිරීම | එල්ලල, කැටැන්වැව, මත්තල, ගොන්නොරුව හා කොහොලංකල ආදී ප්‍රදේශවල පිහිටි ඉඩම් සම්බන්ධයෙන් ව්‍යාජ නින්දගම් ඔප්පු පෙන්වමින් විකිනීම් කටයුතු සිදුකරන බවටත්, ව්‍යාජ ලෙස සින්නක්කර ඔප්පු සකස් කරන බවටත් කරුණු ඉදිරිපත් විය.<br>මේ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතින අතර අවශ්‍ය සාක්ෂි සපයා ගැනීමේ දී පවතින සිතියම් හා වාර්තා ප්‍රමාණවත් නොවීම නිසා ගැටළු මතු වී ඇති බව ප්‍රකාශ කරන ලදි. | අදාල ආයතන විසින් නිවැරදි සැලසුම් හා තොරතුරු ලබා දෙන ලෙසත්, ඒ අනුව විමර්ශන කටයුතු කඩිනම් කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම්-හම්බන්තොට / ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී-තංගල්ල / ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී |
| 7.2 | වීරකැටිය - මිද්දෙනිය මාර්ගය පුළුල් කිරීමේ දී දේපල අහිමි වූවන්ට වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීම | වීරකැටිය - මිද්දෙනිය මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා මාර්ගය දෙපස ඉදිකර තිබූ කාමර කඩා ඉවත් කර වසර ගණනාවක් ගත වී ඇතත්, මේ දක්වා අදාල වන්දි මුදල් ගෙවා නොමැති බවටත්, තක්සේරු වාර්තා ප්‍රමාද වීම ඊට හේතු වී ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br>පවරා ගත් ඉඩම් කැබලි 298ක් අතරින් 74ක් තක්සේරුව සඳහා යවා ඇති බවත්, 5ක් සඳහා වන්දි ගෙවා ඇති බවත්, 56ක ගැටළු හේතුවෙන් උසාවියට යොමු කොට ඇති බවත්, අනවසර කැබලි 94ක් හා වන්දි ඉල්ලා ඇති ගණන 67ක් වන බවත් ප්‍රකාශ කරන ලදි. | මෙම මාර්ගය පමණක් නොව වන්දි ගෙවිය යුතු සියළුම මාර්ගවලට අදාල කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - වීරකැටිය / දිස්ත්‍රික් තක්සේරු කරු |
| 7.3 | ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර වැඩසටහන යටතේ ඉදිකිරීමට යෝජිත තිස්සමහාරාම කොටුමා උප පොල සඳහා ඉඩම් අත්පත් කර ගැනීම | තිස්ස, කතරගම අඩු වෝල්ටීයතාවය අවම කිරීමේ අරමුණින් විදුලි උප පොලක් ස්ථාපිත කිරීම සඳහා වගා කරමින් පවතින කුඹුරු ඉඩමක් පවරා ගැනීම හේතුවෙන් වසර 57ක පමණ කාලයක සිට එහි වගා කරන අඳ ගොවීන් දැඩි අපහසුතාවයකට පත් වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>මෙම ව්‍යාපෘතිය කොළඹ ව්‍යාපෘති අංශයෙන් ක්‍රියාත්මක වන බවට කරුනු ඉදිරිපත් විය. | ව්‍යාපෘති අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කර අඳ ගොවියාට ද අසාධාරණයක් නොවන පරිදි අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රධාන විදුලි ඉංජිනේරු - ලංකා විදුලිබල මණ්ඩලය |
| 7.4 | වීරවිල නව නගරයේ කර්මාන්ත සඳහා වෙන් කර ඇති ඉඩම් ලබා ගැනීම | විවිධ කර්මාන්ත සඳහා පර්චස් 40 බැගින් ඉඩම් කැබලි ටෙන්ඩර් පටිපාටිය යටතේ බෙදා දීමට ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලැබී ඇති බවත්, තක්සේරු මෙතෙක් ලැබී නොමැති බැවින් ඉඩම් ලබා දීම ප්‍රමාද වී ඇති බවට කරුනු ඉදිරිපත් විය. | එම කටයුතු කඩිනම් කරන ලෙසත්, ටෙන්ඩර් පටිපාටිය පිළිබඳ තොරතුරු ඉදිරිපත්කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් - හම්බන්තොට |
| 7.5 | ලුණුගම්වෙහෙර කොන්ක්‍රීට් අංගනයේ සංවර්ධන කටයුතු | දැනට අක්කර 2ක ඉඩමක් ලබා දී ඇති අතර කමිටුවේ අනුමැතිය මත තව දුරටත් අවශ්‍ය ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් වෙතින් ඉල්ලීම් කල | කමිටුවේ අනුමැතිය ඒ සඳහා ලබා දුන් අතර ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් | නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් - හම්බන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | සඳහා රජයට අයත් අක්කර 2.5ක ඉඩම ලබා ගැනීම | හැකි බවත් පෙන්වාදෙන ලදි. | ලබා දුනි. | |
| 7.6 | වලවේ ගඟ රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් හේතුවෙන් මතු වී ඇති ගැටළු | මෙම පදිංචිකරුවන් හේතුවෙන් වලවේ ගඟේ ජල පවිත්‍රතාවයට විශාල බලපෑමක් සිදුවී ඇති බවට කරුණු ඉදිරිපත් විය. මෙම පිරිස් සඳහා විකල්ප ඉඩම්ලබා දී තිබියදී ඔවුන් විසින් නාගරික ප්‍රදේශයෙන් ඉඩම් ඉල්ලීම් සිදු කරන අතර නගර සීමාවේ එවැනි ඉඩම් නොමැති බවත්, උඩපිටගොඩ ප්‍රදේශයෙන් ලබා දිය හැකි බවත් දන්වන ලදි. මීට පෙර ද මේ අය සඳහා ඉඩම් ලබා දී ඇති බවට ද තොරතුරු අනාවරණය විය. | මීට පෙර ඉඩම් ලබා දී ඇත්නම් ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත්, ඉවත් වීමට කැමැත්ත දක්වන අය කඩිනමින් ඉවත් කිරීමට හා ඉවත් වීමට අකමැති අය සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - අම්බලන්තොට |
| 7.7 | වීරවිල ඉඩම කජු සංස්ථාව වෙත පවරා ගැනීම | එම ඉඩම කජු වගාව සඳහා සුදුසු නොවන බවත්, අක්කර 10ක ප්‍රමාණයක් යොදා ගන්නා ආකාරය පිළිබඳව ගැටළු පවතින බවත් ප්‍රකාශ කරන ලදි.<br>සංවර්ධන කටයුතු වෙනුවෙන් කජු සංස්ථාව වෙතින් පවරා ගත් ඉඩමට විකල්ප වශයෙන් මෙම ඉඩම ලබා දී ඇති බවත්, කජු ප්‍රභේද හඳුන්වාදීම, කජු අලෙවිසැල් ආරම්භ කිරීම සහ සුභසාධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂිත බවත් ඒ සඳහා අක්කරයක ප්‍රමාණයක සැලසුම් සකස් කර ඇති බවත්, ප්‍රකාශ කරන ලදි. | අක්කර දෙකක පමණ ප්‍රමාණයක් ලබා දීම සම්බන්ධයෙන් ොසායා බලා අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම්/ තිස්සමහාරාම ය / කළමනාකරු - ශ්‍රී ලංකා කජු සංස්ථාව |
| 7.8 | හුංගම රණවිරුගම ආබාධිත පවුලක් සඳහා අම්බලන්තොටින් ඉඩමක් ලබා දීම. | ආබාධිත රණවිරු පවුලක් සඳහා නිවසක් තනා ගැනීමට අම්බලන්තොට ප්‍රදේශයෙන් ඉඩමක් හඳුනාගෙන ඇති අතර ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලෙස ප්‍රකාශ කරන ලදි. | ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර ඉදිරි කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - අම්බල්තොට |
| 7.9 | ගොන්නෝරුව මීගහජඳුර මාර්ගය පුළුල් කිරීමේදී අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ලබා දීම ප්‍රමාද වීම. | වන්දි ගෙවීමට අදාල තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇතිබව ප්‍රකාශ කරන ලදි. | එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට / දිස්ත්‍රික් තක්සේරුකරු |
| 7.10 | හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්ක ආශ්‍රිතව රබර් වගාව ව්‍යාප්ත කිරීම. | අපනයන වෙළඳපොල ඉලක්ක කර ගනිමින් ඉදි කිරීමට නියමිත ටයර් කම්හල සඳහා අමුද්‍රව්‍ය ලෙස රබර් සැපයිය හැකි බවත් ඒ සඳහා මධ්‍යකාලීන සැලැස්මක් යටතේ දිස්ත්‍රික්කය තුල රබර් වගාව ප්‍රචලිත කිරිම සඳහා සැලැස්මක් දියත් කර යුතු බවටත් කරුණු ඉදිරිපත් විය. මේ සඳහා | මේ සම්බන්ධව කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය රබර් පාලන අධ්‍යක්ෂ |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | රජය මඟින් ලබා දෙන ණය සහන වැඩසටහන් ද උපයෝගී කර ගත හැකි බවට ද කරුණු ඉදිරිපත් විය. | | |
| 7.11 | දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා පවරා ගත් ඉඩම් සඳහා ලබා දුන් විකල්ප ඉඩම්වලට ඔප්පු ලබා දීම ප්‍රමාදවීම. | මෙම ඉඩම් ව්‍යාපෘති කාර්යාලය විසින් මිලදී ගත් ඉඩම් වන බැවින් ඔප්පු ලබා දීමේ ගැටළුවක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | ව්‍යාපෘති අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කොට එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ව්‍යාපෘති අධ්‍යක්ෂ - දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය/ ප්‍රාදේශීය ලේකම් - අඟුණකොළ පැලැස්ස. |
| 7.12 | ශ්‍රී රාවණ සිත්ගිමන්හල සඳහා හම්බන්තොට ප්‍රදේශයෙන් ඉඩමක් ලබා ගැනීම | දුෂ්කර පළාත්වල අවම පහසුකම් යටතේ පවතින විහාරස්ථානවල භික්ෂූන් වහන්සේලාගේ දැනුම, කුසලතා වැඩිදියුනු කිරීම සඳහා පාරම්පරික ශිල්ප ශාස්ත්‍ර හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අවබොධයක් ලබා දීමේ අරමුණින් මෙය ස්තාපිත කිරීමට යෝජනා කර ඇති බවටත්, ඒ සඳහා හම්බන්තොට අවටින් අක්කර 5ක පමණ භූමියක් ලබා ගත යුතු බවටත් කරුණු ඉදිරිපත් විය. | මහවැලි බල ප්‍රදේශයෙන් මේ සඳහා සුදුසු ඉඩමක් සොයා වාර්තා කරන ලෙස උපදෙස් ලබා දුනි. | ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 7.13 | මිරිජ්ජවිල සේවා පියසක් සඳහා සුදුසු ඉඩමක් ලබා ගැනීම | මිරිජ්ජවිල කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට යාබදව පිහිටි වල්බිහි වී ඇති ඉඩම් කොටස සේවා පියස ඉදිකිරීම සඳහා සුදුසු බවට අදහස් ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |
| **08** | **මාර්ග සංවර්ධන ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 8.1 | මාර්ග හා පොදු සංවර්ධන ව්‍යාපෘති සඳහා බොරළු පස් ලබා ගැනීමේ දී පවතින ගැටළු | පොදු සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය පස් හා බොරළු ලබා ගැනීමට මහවැලි අධිකාරිය මඟින් ඉල්ලීම් කලද, ඒ සඳහා අනුමැතිය ලබා දීම අධ්‍යක්ෂ ජනරාල්,මහවැලි අධිකාරිය මඟින් සිදුකරන බැවින් වැඩි කාලයක් ගතවීම නිසා අනවශ්‍ය ප්‍රමාදයන් ඇතිවන බවට කරුණු ඉදිරිපත් විය.<br>පවතින නීති අනුව කියුබ් 35ට වැඩි ප්‍රමාණයන් සඳහා ප්‍රධාන කර්යාලයේ අනුමැතිය ලබා ගත යුතුව ඇති බවට කරුණු ඉදිරිපත් විය. | දිස්ත්‍රික් මට්ටමින් අනුමැතිය ලබා දීමේ කියුබ් ප්‍රමාණය වැඩිකිරීම සුදුසු බව කමිටු තීරණයක් ලෙස අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි අධිකාරිය දන්වා යැවීම සුදුසු බවට තීරණය කරන ලදි. | නේවාසික ව්‍යාපාර කලමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 8.2 | මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මතු වී ඇති ගැටළු | මාර්ග සංවර්ධනය කිරීමේ දී ප්‍රදේශයේ ජනතාවගේ දෛනික ජීවිතයට බාධා ඇති වීම හේතුවෙන් ජනතාව තුල අප්‍රසාදයක් ඇති වී ඇති බවටත්, නිවාස ජලයෙන් යට වීම, නිවාසවලට ඇති පිවිසුම් සංවර්ධනය නොවීම, කටයුතු ප්‍රමාද වීම, ඇතම්විට පාරවල් පටු වීම වැනි ගැටළුවලින් ජනතාව පීඩාවට පත්වී ඇති බවටත් කරුණු ඉදිරිපත් වූ අතර, ප්‍රාදේශීය දේශපාලන නායකත්වය සහ | මේ සම්බන්ධයෙන් සොයා බලා ගැටළු අවම වන පරිදි කටයුතු කරන ලෙසත් දන්වන ලද අතර ඉදිකිරීම් ප්‍රමාද වීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් වෙතින් ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් | දිස්ත්‍රික් ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ප්‍රදේශයේ ජනතාව සමඟ මනා සම්බන්ධීකරණයක් නොමැති වීම මත මෙවැනි ගැටළු පැන නැගී ඇති බව පෙන්වා දෙන ලදි. ඉදිකිරීම් කටයුතු ප්‍රමාද කරන කොන්ත්‍රාත්කරුවන් සඳහා නැවත වෙනත් ව්‍යාපෘති පැවරීම ගැටළු සහගත බව ද පෙන්වා දෙන ලදි. | ලබා දුනි. | |
| 8.3 | රන්මුදුවැව මාර්ගය මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ගැනීම | මාර්ග නඩත්තු කිරීම ප්‍රාදේශීය සභාවට අපහසුතාවයක් පවතින බැවින් එය අධිකාරියට පවරා ගැනීම සුදුසු බවට අදහස් ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් කමිටුවේ අනුමැතිය ලබාදුන් අතර අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබා දුනි. | දිස්ත්‍රික් ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| **09** | **ධීවර ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 9.1 | මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීමේ ව්‍යාපෘතය සඳහා පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩම් කොටසක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම | මිරිදිය කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා මත්ස්‍ය ඇසිත්තන් ලක්ෂ 150ක් තැන්පත් කිරීමේ මෙම ව්‍යාපෘතිය රිදියගම ග්‍රාම නිලධාරී වසමේ ක්‍රියාත්මක කිරීම සඳහා පශු සම්පත් මණ්ඩලයට අයත් භූමියෙන් අක්කර 8ක ප්‍රමාණයක් ඉල්ලා ඇති අතර එම ඉඩම් ගොවිපල භූමියෙන් ලබාදීමට හැකියාවක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ජලජීවී වගා ව්‍යාප්ත නිලධාරී |
| 9.2 | පැසිපික් ඉස්සන් වගාව පිළිබඳ ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් නොවීම. | මේ සම්බන්ධයෙන් වෙනම වෙරළබඩ අංශයක් ක්‍රියාත්මක වන බවත් , ඒ සම්බන්ධ දැනුවත්භාවයෙන් යුතු ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් නොමැතිවීම හේතුවෙන් නව බඳවාගැනීම් සිදුකරන බවත්, එතෙක් ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් මගින් දැනුවත් කිරීම් කල හැකි බවත් ප්‍රකාශ කරන ලදි. | එම කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් ලබාදුනි. | ප්‍රාදේශීය ජලජීවී වගා ව්‍යාප්ත නිලධාරී |
| **10** | **කර්මාන්ත හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ගැටළු.** | | | |
| 10.1 | දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සඳහා අත්පත් කරගත් බෙලිඅත්ත ග්‍රාම සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි පුහුණු මධ්‍යස්ථානය නැවත ස්ථාපිත කිරීම. | මේ සඳහා බෙලිඅත්ත හත්බෝධිය වත්ත නැමති ඉඩමෙන් පර්චස් 12.5 ක ප්‍රමාණයක් ව්‍යාපෘතියේ ඉල්ලීම මත ලබාදීමට එම ඉඩමේ හිමිකරු කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර පවරා ගැනීමක් සිදු කළ නොහැකි බැවින් අත්පත් කර ගැනීට අවශ්‍ය කටයුතු සිදුකරන බවට කාරුණු ඉදිරිපත් විය. | අත්පත් කරගැනීම් කටයුතු සිදු කරන තෙක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පුහුණු කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමේ වගකීම දැරිය යුතු බවත්, මේ පිළිබඳ වාර්තාවක් ලබාදීම සුදුසු බවටත් තීරණය කරන ලදි. | මාර්ග සංවර්ධන අධිකාරිය |
| **11** | **වන ජීවී හා වන සංරක්ෂණ ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 11.1 | ජංගම ලී ඉරුම්හල් සඳහා අවසරපත් | වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මේ වන විට ඉරුම් හල් 19 ක් සඳහා අවසරපත් ලබා දී ඇති අතර | දීර්ඝකාලීන වශයෙන් කර්මාන්තය සිදු කරන අයට අදාල | ප්‍රාදේශීය ලේකම් වලස්මුල්ල |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | ලබාදීමට අනුමැතිය ලබා ගැනීම. | තවත් ඉල්ලුම්පත් 34 ක් ඉදිරිපත් කර ඇති බවත් අවශ්‍යතාවය පදනම් කරගනිමින් කීපයක් සඳහා අවසර ලබා දීම සුදුසු බැවින් ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලෙස ප්‍රකාශ කරන ලදි. | නිර්නායකයන් සලකා බලමින් අවසර ලබා දීම හා මේ වන විට ලබා දී ඇති අවසර පත් සම්බන්ධයෙන් නිර්නායකයන් සම්පූර්ණ කර ඇත්ද යන්න පිලිබඳව විමර්ශනය කරමින් සීමිත සංඛ්‍යාව අභිබවා නොයන පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | |
| **12** | **නගර සැලසුම් ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 12.1 | ලුණුගම්වෙහෙර නගර සැලසුම් කඩිනම් කිරීම | ලුණුගම්වෙහෙර 22 හංදියේ සිට මත්තල දක්වා මාර්ගය දෙපස අනවසර ඉදිකිරීම් හේතුවෙන් සංවර්ධන කටයුතු සඳහා බාධා එල්ල වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | එම ප්‍රදේශය නගරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කරන ලෙසත්, නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එකතු වී සැළසුම් සකස් කරන ලෙසත් උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - ලුණුගම්වෙහෙර / නියොජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය/ නියොජ්‍ය අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය /දිස්ත්‍රික් ඉංජිනේරු - මාර්ග සංවර්ධන අධිකාරිය |
| 12.2 | හම්බන්තොට සිසිලසගම වැව් රක්ෂිතයේ අනවසර ඉදිකිරීම් හේතුවෙන් මතු වී ඇති ගැටළු | වැව් රක්ෂිතය මැන වෙන්කර තිබිය දී විවිධ ව්‍යාපාර කටයුතු සඳහා බලපත්‍ර ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් විය. වරාය ඉදිකිරීම් හේතුවෙන් ව්‍යාපාර අහිමිවූවන් එම සථානවල ව්‍යාපාර කටයුතු කරන බවට අනාවරණය වූ අතර එම අය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් විකල්ප ස්ථාන ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | එම ස්ථානවල ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට/ නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| **13** | **වෙනත් ගැටළු** | | | |
| 13.1 | අනියම්, ආදේශ, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම | පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගෙන ඇති මෙම සේවකයන් වෙනුවෙන් EST/04/03/PMT/0253 හා 2019.09.18 දිනැති චක්‍රලේඛය, 20/2014 හා 25/2014(01) යන චක්‍රලේඛ මඟින් ලබාදුන් සහන DSM/Policy/Recruitments හා 2/1/37 යන චක්‍රලේක මඟින් කප්පාදු වන බවත්, මෙම චක්‍රලේඛවල පවතින | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබාදුනි. | ප්‍රධාන ලේකම් - දකුණු පළාත් සභාව |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | පරස්පරතාවයන් නිවැරදි කර ගත යතු බවටත් කරුණු ඉදිරිපත් කරන ලදි. | | |
| 13.2 | තංගල්ල විවිධසේවා සමූපකාර සමිතියේ මතුවී ඇති ගැටළු | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් විසින් සමිතියේ සභාපතිවරයාගේ රාජකාරි සඳහා බාධා පමුණුවන බවට කරුණු ඉදිරිපත් විය. අධ්‍යක්ෂ මණ්ඩල දෙකක් පිහිටුවාගෙන කටයුතු කිරීම හේතුවෙන් මෙම ගැටළු මතු වී ඇති බවටත්, නිලධාරීන් විසින් සමිතියේ නිලධාරීන්ට පහරදීමක් සිදු කර නොමැති බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබාදෙන ලෙස උපදෙස් ලබාදුනි. | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් |
| 13.3 | සූරියවැව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු ස්ථාන ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම | සූරියවැව බල ප්‍රදේශය තුල ප්‍රාදේශීය සභාවට මෙතෙක් පවරා නොගත් පොදු ස්ථාන බොහෝමයක් පවතින බවට කරුණු ඉදිරිපත් විය. ඇතැම් ස්ථාන මැනුම් කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති අතර සීමා නිරවුල් කර ගැනීමෙන් අනතුරුව ලබාදිය හැකි බව ප්‍රකාශ කරන ලදි. | මැනුම් කටයුතු කඩිනම් කරන ලෙසත්, දැනට මූලික කටයුතු අවසන් කර ඇති ස්ථාන පවරා දීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලබාදුනි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 13.4 | හෙළ බොජුන්හලක් සඳහා ඉඩමක් වෙන් කර ගැනීම | තංගල්ල යායවත්ත තරුණසේවා සභාව ආසන්නයේ මේ සඳහා සුදුසු ඉඩමක් හඳුනාගෙන ඇති බවත්, ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදි. එම කොටස නාගරික සංවර්ධන අධිකාරියට අයත් වන අතර හෙළ බොජුන්හල සඳහා ලබා දීමට හැකියාවක් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | අදාල සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබාදෙන ලෙස උපදෙස් ලබාදුනි. | අධ්‍යක්ෂ - කෘෂිකර්ම /නියොජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |
| 13.5 | වලස්මුල්ල තොග පොළෙහි පැවති ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම | වලස්මුල්ල තොග පොළ පවත්වාගෙන ගිය ප්‍රාදේශීය සභාවට අයත් මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිලධාරීන්ගේ පරිහරණය සඳහා තාවකාලිකව ලබා දී තිබූ අතර එයඉවත් කිරීම විශාල ගැටළුවක් බව පෙන්වා දෙන ලදි. නාගරික සංවර්ධන අධිකාරියේ දැනුම්දීමකට අනුව එය ඉවත් කර ඇති බවට කරුණු ඉදිරිපත් වූ අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් එවැනි ඉල්ලීමක් සිදුකර නොමැති බව දන්වන ලදි. නැවත ඉදිකර දෙන ලෙස කරනු ලබන ඉල්ලීමකට අනුව ගොඩනැගිල්ල ඉදිකර දිය හැකි බව යුධ හමුදාව ප්‍රකාශ කරන ලදි. | මෙම ගොඩනැගිල්ල අයත් ප්‍රාදේශීය සභාවේ අවසරයකින් තොරව යුධ හමුදාව විසින් මෙවැනි ක්‍රියාවක් කිරීම පිළිබඳව සභාවේ අවධානය යොමු වූ අතර එය නැවත තිබූ ආකාරයට සකස් කරදීම යුධ හමුදාවේ වගකීමක් බව පෙන්වා දෙන ලදී. එම නිසා ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා නැවත ඉල්ලීමක් සිදු කිරීම අවශ්‍ය නොවන බවත් මෙම සාකච්ඡාවේ දී තීරණය වූ පරිදි කඩිනමින් ගොඩනැගිල්ල ඉදිකරදෙන ලෙසත් දන්වන ලදී. | අණදෙන නිලධාරී - ශ්‍රී ලංකා යුධ හමුදාව / නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය / සභාපති - වීරකැටිය ප්‍රාදේශීය සභාව |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 13.6 | වීරකැටිය මිනිද්දොරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ලබා ගැනීම | මේ සඳහා රජයට අයත් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම සඳහා සුදුසු ඉඩම් කොටසක් ලබා ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි. | සුදුසු ඉඩමක් හඳුනාගෙන වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම් - වීරකැටිය / ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී - හම්බන්තොට |
| 13.7 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා ඉන්ධන ගබඩා ටැංකි ස්ථාපිත කිරීම සඳහා වරාය ආශ්‍රිතව සුදුසු ඉඩමක් වෙන් කර ගැනීම | මේ සඳහා මහවැලි බල ප්‍රදේශයෙන් හඳුනාගෙන ඇති අක්කර 100ක ප්‍රමාණය අලි කළමනාකරණ රක්ෂිතයට අයත් වන බැවින් මේ සඳහා නිදහස් කර දීමට හැකියාවක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. වරාය ආරබොක්ක ඉඩම මේ සඳහා සුදුසු බවට කරුණු ඉදිරිපත් වූ අතර එම ඉඩම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පවරා දී ඇති බැවින් මහවැලි අධිකාරියට අයත් වෙනත් ස්ථානයක් හඳුනාගෙන ඇත්නම් ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරන ලෙස ප්‍රකාශ කරන ලදි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබාදුනි. | සභාපති- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව නේවාසික ව්‍යාපාර කළමනාකරු- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 13.8 | තිස්සමහාරාම බස් නැවතුම්පලේ ඇති ශ්‍රී ලංගම සේවක විවේකාගාරයේ ගැටළුව | ශ්‍රී ලංගම වෙනුවෙන් වෙන් කර ඇති තිස්සමහාරාම බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ කාමරය බස් රථවල සේවය කරන සේවක මහතුන්ගේ භාවිතයට ගැනීම සඳහා වෙන් කර ගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි. | මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි. | සහකාර අධ්‍යක්ෂ - දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය |
| 13.9 | වලස්මුල්ල පොළ පැවැත්වෙන ස්ථානය විධිමත් කිරීම | පොළ පැවැත්වෙන ස්ථානයේ කටයුතු සම්පූර්ණ නොවීම හේතුවෙන් වෙළඳුන් හා පාරිභෝගිකයන් අපහසුතාවයන්ට මුහුණ දී ඇති බවට කරුනු ඉදිරිපත් විය. | මැයි මාසය අවසන් වන විට අවශ්‍ය කටයුතු සම්පූර්ණ කරන ලෙස උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන අධිකාරිය |

මසකට වරක් ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටු රැස්වීම් පැවැත්වීමේ අවශ්‍යතාවය පෙන්වා දෙමින් ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවලදී සාකච්ඡා කොට විසඳුම් ලබා ගත යුතු ගැටළු එහිදී විසඳා ගැනීමට කටයුතු කරන ලෙසත්, ඒ සඳහා ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් ඊට යොමු කරන ලෙසත් දැන්වීමෙන් අනතුරුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුවේ සියළුම සාමාජිකයන් වෙත ස්තූතිය පලකරමින් ප.ව 2.00ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

ඩබ්ලිව්.එච්. කරුණාරත්න
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

ඩබ්ලිව්. එච්. කරුණාරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

2021මාර්තු මස ..23........ දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.